ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2023/2024
අවසාන පරීක්ෂණය
**STP9617** - ගුරු අධ්‍යාපනය
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.08.21 | වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

01. (i.) ගුරුවරුන් සඳහා ලබා දෙන පූර්වසේවා පුහුණුව හා සේවාස්ථ පුහුණුව අතර ඇති වෙනස්කම් **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) ගුණාත්මක වෘත්තීය සංවර්ධනයක් සඳහා ගුරුවරුන් තුළ ගුරු නිපුණතා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii.) ගුරුවරුන් තුළ සංවර්ධනය කළ යුතු ගුරු නිපුණතා **පහක් (05)** සඳහන් කර, ඒවා සංවර්ධනය කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

02. (i.) වෘත්තිකභාවය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තිය වෘත්තියක් ලෙස සැලකෙන්නේද? ඔබේ පිළිතුරු හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ ගුරුවරයා වෘත්තීය තත්ත්වයට උසස් කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පරීක්ෂා කරන්න. (ලකුණු 10)

03. (i.) ගුරුවරුන් සඳහා ආචාරධර්ම පද්ධතියක් අවශ්‍ය වීමට හේතු **පහක් (05)** ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව ඇගයීමක් කරන්න. (ලකුණු 10)

(iii.) ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් සැපයෙන ගුරු පුහුණු වැඩසටහන් විවේචනාත්මකව විස්තර කරන්න. (ලකුණු 10)

04. (i.) ගුරු අධ්‍යාපන වැඩසටහන්වලින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන තුළ මෙම අරමුණු කොතෙක් දුරට සාක්ෂාත් වේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

(iii.) ගුරු අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමේදි ගුරු අධ්‍යාපන ආයතන මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

05. (i.) ගුරු බලවන්තකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් බලවන්තකරණය සඳහා ගෙන ඇති ප්‍රශස්ත පරිචයන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii.) ගුරුවරුන් බලවන්තකරණය කිරීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග **පහක් (05)** දක්වන්න. ඒවා මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. (i.) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලාංකීය ගුරුවරුන් සඳහා ක්‍රමවත් උසස්වීම් පටිපාටියක් යෝජනා කරන්න. (ලකුණු 10)

(iii.) පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පතිවරුන් මුහුණ දෙන අභියෝග විමසුමට ලක් කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -